# ශ්‍රී ලංකා නිදහස් පක්ෂය
# ஸ்ரீ லங்கா சுதந்திரக் கட்சி
# SRI LANKA FREEDOM PARTY

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| සභාපති | : | මෛත්‍රීපාල සිරිසේන | ප්‍රධාන ලේකම් | : | නීතිඥ දයාසිරි ජයසේකර | භාණ්ඩාගාරික | : ලසන්ත අලගියවන්න |
| தலைவர் | : | மைத்ரிபால சிறிசேன | பிரதான செயலாளர் | : | தயாசிறி ஜயசேகர (சட்டத்தரணி) | பொருளாளர் | : லசந்த அலகியவன்ன |
| President | : | Maithripala Sirisena | Secretary | : | Dayasiri Jayasekara (Attorney-at-Law) | Treasurer | : Lasantha Alagiyawanna |


2021.08.03

අතිගරු ජනාධිපති,
ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා,
ජනාධිපති ලේකම් කාර්යාලය,
කොළඹ 01.

අතිගරු ජනාධිපතිතුමනි,

<u>ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ජාතික ආරක්ෂක විද්‍යාල පනත</u>

උසස් අධ්‍යාපනය සම්බන්ධයෙන් නවීන ලෝකයට ගැලපෙන පරිදි යාවත්කාලීන කළ රැකියා අභිමුඛ උපාධි පාඨමාලා වර්ධනය කිරීම, උපාධිධාරීන් සඳහා ඉඩ ප්‍රස්ථා වැඩිකිරීම, තුන්වන ලෝකයේ රටවලට පවා මුදල් ගෙවා උසස් අධ්‍යාපනය ලැබීමට අපේ දරුවන් විදේශගත වීමේ ප්‍රවණතාවයට පිළියම් සෙවීම, උපාධියක් ලබා දීමට ගත වන අනවශ්‍ය කාලය අඩු කිරීමට කටයුතු කිරීම, නවක වදය සහ විනය පිළිබඳ ප්‍රශස්ත පාලනයක් කිරීම යන කරුණු සම්බන්ධව පිළිතුරු සෙවීමේ බරපතළ වගකීමක් රජය සතු බව අපි පිළිගනිමු.

එසේ වුවද රටේ වර්තමාන තත්ත්වයන්ද සැලකිල්ලට ගෙන 2021.08.02 දින ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රී කණ්ඩායම් රැස්වීමේදී අවසානයේ එකග වූ පරිදි උක්ත කරුණු සම්බන්ධයෙන් පාර්ලිමේන්තු තේරීම් කාරක සභාවක් මගින් නිශ්චිත කෙටි කාලසීමාවකින් පුළුල් සමාජ කතිකාවක් ඇති කොට මේ සම්බන්ධව ස්ථිරසාර තීරණයකට එළඹීම වඩාත් යහපත් බව අප පක්ෂයේ හැඟීමයි.

එසේ නොමැතිව දැනට ඉදිරිපත් වී ඇති අදාල පනත කඩිනමින් ගෙන එන්නේ නම් ඒ සඳහා පහත සංශෝධන ඉදිරිපත් කිරීම අප පක්ෂයේ මතයයි.

1. ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ජාතික ආරක්ෂක විශ්ව විද්‍යාලය විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිසමේ නියාමනය හා පාලනයෙන් බැහැර නොකිරීම.

2. සාමාන්‍යයෙන් වසරකට සිසුන් දෙලක්ෂයකට ආසන්න ප්‍රමාණයක් උසස් පෙළ විභාගයෙන් විශ්ව විද්‍යාල අධ්‍යාපනය සඳහා අවම සුදුසුකම් ලබන නමුත්, විශ්වවිද්‍යාල පද්ධතියේ අභයන්තර සිසුන් ලෙස අධ්‍යාපනය ලැබීමට අවස්ථාව හිමිවන්නේ 35000 අඩු ප්‍රමාණයකට බැවින් බහුතරයක් වූ ඉතිරි දරුවන්ගේ අයිතිවාසිකම සුරක්ෂිත කරමින් මෙම විශ්වවිද්‍යාලයද ආරක්ෂක අංශයේ නිලධාරීන් නොවන උපාධි අපේක්ෂකයින් ඇතුළත් කර ගැනීමේදී විනිවිදභාවයෙන් යුතු (Z අගය මත පදනම් වූ) සාධාරණ ක්‍රමයක් පැහැදිලිව පනතේ සඳහන් කිරීම.

3. මෙම ආයතනයේ අධ්‍යාපනය ලැබීමට ගාස්තුවක් ගෙවීමට සිදුවන බැවින් අඩු ආදායම්ලාභී විශාල සමාජ ස්ථරයක් ඇති අප රටේ දරුවන්ට සාධාරණ ක්‍රමයක් ලෙස පෙර පැවති ලෙස රැකියාවක් කරමින් උපයන ආදායමකින් ගෙවීමේ පදනම මත ණය මුදලක් ලබා දීම.


301, ටී.බී. ජයා මාවත, කොළඹ 10. 301, டி.பி. ஜயா மாவத்தை, கொழும்பு 10. 301, T.B. Jayah Mawatha, Colombo 10.
දුරකථන : மின்னஞ்சல Tel: +94 011 2680125, +94 011 2680126, +94 011 2680127, +94 011 2680128, +94 011 3138118
ෆැක්ස් : பெக்ஸ் : Fax: +94 011 2680187 විද්‍යුත් තැපෑල : E-mail: slfphqrs@gmail.com

4. පාලක සභාවල සිවිල් සාමාජික සංඛ්‍යාව බහුතරයක් බවට පත් කිරීම.

විශේෂයෙන් අප පක්ෂයේ උපාධිධාරී සංවිධානය, ශිෂ්‍ය සහ තරුණ සංවිධානයත් එමෙන්ම අප පාර්ලිමේන්තු මන්ත්‍රී කණ්ඩායමම පුළුල් සංවාදයක යෙදී ඔබතුමන්ට ඉදිරිපත් කරන මෙම කරුණු පිළිබඳව විශේෂ අවධානය යොමු කරනු ඇතැයි කාරුණිකව බලාපොරොත්තු වෙමු.

ස්තූතියි,

මෙයට - විශ්වාසී,

රංජිත් සියඹලාපිටිය
ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ජාතික ආරක්ෂක විශ්වවිද්‍යාල පනත
අධ්‍යනය කිරීමට පත්කළ ශ්‍රී ලංකා නිදහස් පක්ෂ කමිටුවේ සභාපති.

පිටපත්:-

1. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ගරු සභාපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා.
2. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ගරු මහ ලේකම් දයාසිරි ජයසේකර මැතිතුමා.